www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගාසා තීරයට අත නොතබනු

## Hands off Gaza!

**2009 ජනවාරි 5**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ගාසා තීරයේ පලස්තීන ජනතාවට එරෙහි ඊශ්‍රායල මිලිටරියේ මිනීමරු ප්‍රහාරය හෙලා දකී. අධික ජනගහනයකින් යුක්ත මුලුමනින් ම පාහේ අනාරක්ෂිත භූමි ප්‍රදේශයක් මත එල්ල කෙරෙන ඒකාබද්ධ ගුවන් හා ගොඩබිම් ප්‍රහාර යුද අපරාධයකි.

සිවිල් ඉලක්ක වෙත ගුවනින් හා මුහුදෙන් දැන් එල්ල කෙරෙන නිරන්තර ප්‍රහාර මත්තට එක් වන ඊශ්‍රායල හමුදාවන්ගේ, යුද ටැංකිවල හා කාලතුවක්කු ප්‍රහාර, ආක්‍රමනයේ මුල් දින අට තුල දැනටමත්, කාන්තාවන් හා ළමුන් දුසිම් ගනනාවක් ඇතුලු, පලස්තීන ජීවිත 500කට වඩා බිලිගෙන හා 2,400කට වඩා තුවාල සිදු කර ඇති ලේ වැගිරීම, තියුනු ලෙස උත්සන්න වීමක් සඳහා වේදිකාව සකසයි.

නිරතුරුවම සිදු වන ලෙසට, ඊශ්‍රායල තන්ත්‍රය මිලිටරි ප්‍රචන්ඩත්වය යොදාගැනීම නරුමත්වය, කුහකකම හා රැවටිල්ල විශ්මයජනක මට්ටම්වලට නැංවීම සමග එකට යයි. ලෝකයේ නවීනතම හා අතිශයින්ම සූක්ෂම මිලිටරි යාන්ත්‍රනයක් අතැති රාජ්‍යයක් යලිත් වරක් ගොදුර ලෙස රගපායි.

මෙම මෑතම ආක්‍රමනය හමාස් රොකට් ප්‍රහාරවලට දක්වන යුක්තියුක්ත ප්‍රතිචාරයක් බවට කරන කියාපෑම, ගාසා තීරයේ ප්‍රහාරයට පෙරාතුව සිදු වූ සිද්ධීන් මුසාකරනයට ලක්කරයි. දෙසැම්බර් 27 දා ඊශ්‍රායලය සිය ගුවන් යුද්ධය දියත් කිරීමට පෙර මෑත දී ගාසා සිට විදින ලද ගෘහස්තව තනන ලද බොහෝ සෙයින් ඵල රහිත කසාම් රොකට් ප්‍රහාර මගින් එකදු ඊශ්‍රායල වැසියකු වත් ඝාතනයට ලක්ව නැත. එවන් රොකට් ප්‍රහාර ඉහල යාම ප්‍රකුපිත කලේ, හමාස් ආරක්ෂක හමුදාවන්ගේ සාමාජිකයන් හය දෙනෙකු මරා දමමින් නොවැම්බරයේ දී දේශ සීමා හරහා ප්‍රහාරයක් එල්ල කරමින් ඊශ්‍රායලය සටන් විරාමය බිඳ දැමීම මගිනි. මාස 18ක් තිස්සේ ගාසාහි දිලිඳු ජනයාට ආහාර, ඖෂධ, බෝතල් කල ජලය හා විදුලි බලය අහිමි කර ඇති ගාසා තීරය මත එය පවත්නා ගෙන යන මාරාන්තික සම්බාධක ඉවත් කිරීම ප්‍රතික්ෂේප කරමින්, ඊශ්‍රායලය සටන් විරාම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කලේය. ඔවුන් ම පිලිගත් පරිදි, ඊශ්‍රායලය ප්‍රථම කොටම සටන් විරාමයට එකග වූයේ වත්මන් යුද්ධය සඳහා සූදානම උත්සන්න කරනු පිනිසය.

ඊශ්‍රායලය මෙම මෑතම ආක්‍රමනික වටය දියත් කිරීමෙන් පසුව මේ දක්වා පලස්තීන රොකට් ප්‍රහාර මගින් දකුනු ඊශ්‍රායලයේ වැසියන් සිවු දෙනෙක් ඝාතනයට ලක්ව ඇත. සියලු ජීවිත හානි කනගාටුදායකය. එහෙත් මාධ්‍ය ඊශ්‍රායල හා පලස්තීන ජීවිතවලට වටිනාකම් නියම කිරීමේ දී අතිශයින් වෙනස් සම්මතයන් යොදා ගනී යන්න කැත සත්‍යයකි. සීඑන්එන් හා සෙසු බටහිර මාධ්‍ය සිද්ධීන් ගැන කරන පුවත් ආවරන විනිශ්චය කල විට පෙනී යන්නේ, පලස්තීන ජීවිතවලට ලැබෙන්නේ ඉතා සුලු වටිනාකමක් බවයි. වත්මන් යුද්ධයේ දී පලස්තීන මරන ඊශ්‍රායල මරනවලට දක්වන අනුපාතය එකට 100කටත් වැඩිය. පසුගිය අට වසරක කාලය තිස්සේ, ගාසා තීරයේ සිට එල්ල වූ රොකට් ප්‍රහාරවලින් දල වසයෙන් ඊශ්‍රායල වැසියන් 20ක් මිය ගිය අතර ඊශ්‍රායල හමුදාවෝ පලස්තීනුවන් 5,000කට ආසන්න සංඛ්‍යාවක් ඝාතනය කර තිබේ.

ගාසා සිට එල්ල වන රොකට් ප්‍රහාර මගින් පිලිබිඹු වන්නේ, හමාස් සංවිධානයේ හා පලස්තීන ජනතාවගේ මංමුලාවයි. සිය ආක්‍රමනික හා ප්‍රසාරනික එල්ලයන් හඹායාම සඳහා කඩතුරාවක් නිර්මානය කරගනු පිනිස ඊශ්‍රායලය එවන් ක්‍රියාවන් හිතාමතාම ප්‍රකුපිත කරයි.

ඊශ්‍රායලය විසින් නිර්මානය කරන ලද්දා වූ ද එක්සත් ජනපදයේ, යුරෝපා බලවතුන්ගේ හා එක්සත් ජනපද-ඊශ්‍රායල ඒජන්තයකු වන පලස්තීන අධිකාරියේ ජනාධිපති මහමුද් අබ්බාස් ඇතුලු, ඔවුන්ගේ මිතුරු අරාබි ධනේශ්වර තන්ත්‍රයන්ගේ පිටුබලය ලබන්නා වූ ද ගාසා තීරයේ තත්වය කුමක්ද? ඩෙට්‍රොයිට් නාගරිකයේ ප්‍රමානයට සමාන ප්‍රදේශයක් -- කාන්තාරය සහ මධ්‍යධරනී මුහුද අතර හිරවුනු බිම් තීරුවක් -- තුල මිලියන එකහමාරක ජනතාවක් හිරකරනු ලැබ ඇත. ඔවුහු උතුරට හා නැගෙනහිරට යාම ඊශ්‍රායල හමුදා මගින් ද දකුනට යාම ඊජිප්තු ආඥාදායක මුබාරක්ගේ හමුදා මගින් ද වලකනු ලැබ තිබේ.

සන්සන්දනය මෙන් ම ඊශ්‍රායල තන්ත්‍රයට අප්‍රසන්න ද විය හැකි නමුදු, ගාසාහි ඉරනම වඩාත් ම මතකයට නංවන්නේ, නාසි ආක්‍රමනය යටතේ පැවති පෝලන්තයේ වෝර්සෝ ගීටෝව තුල වාසය කල යුදෙව්වන්ගේ ඛේදනීය ඉරනමයි.

ගාසා ආක්‍රමනයට විරුද්ධ වූ ද තමන්ගේ නාමයෙන් ඊශ්‍රායල තන්ත්‍රය විසින් සිදු කරනු ලබන අපරාධ සම්බන්ධයෙන් ගැඹුරින් ම ලජ්ජා වන්නා වූ ද ඊශ්‍රායල බුද්ධිමතුන්, තරුනයන් සහ පන්ති විඥාත කම්කරුවන් සිටින බවට කිසිදු ප්‍රශ්නයක් නැත. නාසින්ගේ ජනඝාතන මතකයට නංවන අපරාධ සම්බන්ධයෙන් යුදෙව් ජනතාවට චෝදනා එල්ලවීම ගැන ඔවුන් භීතියට පත්ව සිටින බව අපට විශ්වාසය. මත විමසුම් මගින් කියාපාන පරිදි, ඊශ්‍රායල වැසියන්ගෙන් සියයට 80ක් මෙම වධබන්ධනයට ලක් කෙරුනු භූමි ප්‍රදේශය මත එල්ල කෙරෙන මිලිටරි ප්‍රහාරයට සහයෝගය දෙන්නේ නම්, එය සාක්ෂ්‍ය දරන්නේ, ජනගහනයේ පුලුල් කොටස් අතර පවතින අවමංගතවීමේ හා දිරිසුන්භාවයේ ගැඹුරු මට්ටමයි. තමන්ගේ ම සාපරාධී ක්‍රියා යුක්තියුක්ත කරනු පිනිස නාසින් සිදු කල මහා යුදෙව් සංහාරයේ භයංකරත්වය නරුම ලෙස ගසාකෑම, ඊශ්‍රායලයේ අපරාධ අතර පවත්නා දරුනු භාවයෙන් අඩුම එක නොවේ.

කේන්ද්‍රීය අවධාරනය එක්සත් ජනපදයේ ක්‍රියාකලාපය මත තැබීමෙන් තොරව ගාසා මත එල්ල කෙරෙන ප්‍රහාරය ගැන සාකච්ඡා කල නොහැකිය. පසුගිය දශක හතරක කාලය තිස්සේ -- 1967 යුද්ධයෙන් ඊශ්‍රායලය ගාසා තීරය සහ බටහිර ඉවුර අල්ලා ගත් අවස්ථාවේ පටන් මේ දක්වා ම -- ඇමරිකානු පාලක ප්‍රභූව, ඊශ්‍රායලයේ ප්‍රධාන පහසුකම් සපයන්නා සහ සම-කුමන්ත්‍රනකරු ලෙස සේවය කර තිබේ.

බුෂ් පාලනාධිකාරය 2006 ඊශ්‍රායලයේ ලෙබනන ආක්‍රමනයේ දී එය ඉටු කල සාපරාධී ක්‍රියාකලාපය ම යලි ඉටු කරමින් සිටී -- එනම්, පලස්තීනුවන් ඝාතනය කිරීම සහ සතුරු අරාබි ව්‍යාපාරයක් කුඩුපට්ටම් කිරීම පිනිස ඊශ්‍රායලයට උපරිම කාලය සහ ඉඩකඩ ලැබෙන තෙක් සටන් විරාමයක් පිලිබඳ සියලු රාජ්‍යතාන්ත්‍රික මූලිකත්වයන් වලකාලීම සඳහා ඊශ්‍රායලය වෙනුවෙන් මැදිහත්වීමයි. පසුගිය දින කිහිපයේ කාලානුචේදය පෙන්නුම් කරන්නේ, ආංශික වසයෙන්, සටන් විරාමයක් වෙනුවෙන් අතරමැදියකු ලෙස මැදිහත්වීමට යුරෝපා සංගමය දරන ප්‍රයත්නයන් කඩාකප්පල් කරනු පිනිස, ඔවුන්ගේ ගොඩබිම් ආක්‍රමනය දියත් කරන ලෙස ඊශ්‍රායලයෙන් බුෂ් පාලනාධිකාරය ඉල්ලා සිටි බවයි.

සිකුරාදා, යුරෝපා සංගමය සහ ප්‍රන්ස ජනාධිපති සාර්කොසි, සටන් විරාමයකට එකග වන ලෙස ඊශ්‍රායලයට බලකරනු පිනිස සඳුදාට නියමිත ඊශ්‍රායල දූත මෙහෙවරක් නිවේදනය කිරීමෙන් පසුව, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් ධවල මන්දිරය අබියස දී මාධ්‍ය අමතමින් සටන් පිලිබඳව යලිත් වරක් හමාස් සංවිධානයට දොස් පවරා සටන් විරාමයකට ඊශ්‍රායලය දක්වන විරුද්ධත්වයට පිටුබලය සැපයුවාය. සෙනසුරාදා, ඊශ්‍රායලයට වොෂිංටනය හිස් චෙක් පතක් ප්‍රදානය කරන බව යලි සඳහන් කිරීමට, බුෂ් සිය සතිපතා ගුවන් විදුලි කතාව කැපකලේ, එදිනම ඉන් පසුව ආරම්භ වූ ආක්‍රමනය සඳහා වේදිකාව සකසමිනි.

සිය කෙටි කතාව තුල දී, බුෂ්, 2006 දී මහජන ඡන්දයකින් ජයගත්තා වූත් 2007 ජූනි මස දී ෆටා සංවිධානයේ නායකත්වයෙන් යුක්ත හා එක්සත් ජනපද-ඊශ්‍රායල පිටුබලය ලැබෙන පලස්තීන අධිකාරිය විසින් දරන ලද කුමන්ත්‍රන ප්‍රයත්නය පරාජය කලා වූත් හමාස් සංවිධානයට "කුමන්ත්‍රනයකින් ගාසා තීරයේ බලය ඩැහැගැනීම" ගැන චෝදනා කරමින් ද මාස දහ අටකට ඉහත දී පනවන ලද ඊශ්‍රායල සම්බාධක මගින් ඇති කෙරුනු මානුෂ්‍ය ව්‍යසනය සම්බන්ධයෙන් හමාස් සංවිධානයට දොස් නැගීම දක්වා තරම් ඈතට ගමන් කරමින් ද, එකකට පසු එකක් වසයෙන් පච වැමෑරීමට සමත් විය. ඊශ්‍රායල ආක්‍රමනය අවසන් කිරීම සඳහා කොන්දේසියක් ලෙස එක්සත් ජනපද-ඊශ්‍රායල රූකඩයක් වන අබ්බාස් අතින් තමන් බලයෙන් ඉවත් කිරීමට හමාස් සංවිධානය එකග විය යුතු යයි බුෂ් අත්‍යවශ්‍යයෙන් ම ඉල්ලා සිටියේය.

සෙනසුරාදා ම පසුව, ඊශ්‍රායලය සිය ගොඩබිම් ප්‍රහාරය දියත් කිරීමෙන් අනතුරුව, එක්සත් ජනපදය ක්ෂනික සටන් විරාම ගිවිසුමක් ඉල්ලා සිටීමේ ප්‍රකාශයක් වලකාලීම පිනිස එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය තුල මැදිහත් විය.

පෙරදැකිය හැකි පරිදි, ජනාධිපති ලෙස තේරීපත්ව ඇති බරක් ඔබාමා ද ඊට සමානව පිලිකුල් සහගත ක්‍රියාකලාපයක් ඉටු කරමින් සිටින්නේ, එක්සත් ජනපදයට "එක අවස්ථාවක් සිටින්නේ එක ජනාධිපතිවරයෙක් පමනි" යන පදනම මත ප්‍රසිද්ධ නිශ්ශබ්දතාවක් පවත්වා ගෙන යමිනි. මෙහි දී නෛතික මූලධර්මය -- නිශ්ශබ්දතාව අනුමැතිය පෙන්නුම් කරයි -- මුලුමනින් ම අදාල වේ. මෙහි දී සටහන් කරගත යුත්තේ, මීට යන්තම් මාස කිහිපයකට ඉහත දී වෝල් වීදියේ සිය ආධාරකරුවන්ට හා මිතුරන්ට බඳු ගෙවන්නන්ගේ අරමුදල්වලින් ඩොලර් බිලියන සිය ගනනින් දොල පිදේනි දීමේ පියවර ප්‍රවර්ධනය කිරීමේ අවස්ථාව එලැඹි විට, ඔබාමාට එවන් අපහසුතාවක් නොතිබුනු බවයි.

ඔබාමා කමකට නැති නිශ්ශබ්දතාවක් පවත්වා ගෙන යන අතර, නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ කතානායිකා නැන්සි පෙලොසි, සෙනෙට් සභාවේ බහුතර කන්ඩායමේ නායක හැරී රීඩ් සහ ඉලොනොයි ප්‍රාන්තයේ සෙනෙට් සභික ඩික් ඩර්බින් ඇතුලු, ඉහල පෙලේ ඩිමොක්‍රැටික් කොංග්‍රස් සභිකයන් ඊශ්‍රායලයේ ක්‍රියාවන්ට සිය සහයෝගය ප්‍රකාශ කිරීමට මහත් පරිශ්‍රමයක් දරා ඇත.

එක්සත් ජාතීන්ගේ ප්‍රතිචාරය ඊට වඩා නොඅඩු එලිදරව්කාරීත්වයකින් යුක්ත වෙයි. එය සිය බෙලහීනත්වය හා දෙබිඩි පිලිවෙත සංයෝග කිරීම මතකයට නංවන්නේ, 1930 ගනන්වල දී ෆැසිස්ට් ඉතාලිය ඉතියෝපියාව විනාශ කිරීමට ජාතීන්ගේ සංගමය දැක්වූ ප්‍රතිචාරයයි. ජාත්‍යන්තර ධනේශ්වරය විසින් ගොඩනගන ලද ඊනියා "සාම" සංවිධාන අධිරාජ්‍යවාදී බල දේශපාලනයේ උපකරන බවට තමන්වම ඔප්පු කරගන්නා කාල පරිච්ඡේදයක ය අප යලිත් ජීවත් වන්නේ. එක්සත් ජාතීන්ගේත් එය තුල ආධිපත්‍යය දරන අධිරාජ්‍යවාදී ආන්ඩුවලත් කුහකත්වය වඩාත්ම විචිත්‍ර ලෙස එලිදරව් වන්නේ, ඔවුන් "යුද අපරාධ" යන පදය යොදා ගන්නා මුලුමනින් ම අවස්ථාවාදී ආකාරය මගිනි. යුද අපරාධයක් ලෙස අර්ථදක්වනු ලබන්නේ කුමක් ද සහ හේග් නුවර අධිකරනයට යවනු ලබන්නේ කවරෙක් ද යන වග මුලුමනින්ම පදනම් වන්නේ, විවිධ අධිරාජ්‍යවාදී බලයන්ගේ භූ-දේශපාලනික හා ආර්ථික අවශ්‍යතා මත ය.

අවසාන වසයෙන්, මැද පෙරදිග ධනේශ්වර තන්ත්‍රයන්ගේ ද්‍රෝහී වංචාකාරී ක්‍රියාකලාපය පවතී. මෙයට, එක්සත් ජනපදයේ හා ඊශ්‍රායලයේ විවෘත ආධාරකරුවන් -- විශේෂයෙන් ම ඊජිප්තුව, ජෝර්දානය සහ සවුදි අරාබිය -- පමනක් නොව, සියොන්වාදයේ හා අධිරාජ්‍යවාදයේ විරුද්ධවාදීන් යයි කියනු ලබන ඉරානය හා සිරියාව ද ඇතුලත් ය. ටෙහෙරානය හා දමස්කස් තන්ත්‍ර දුර්වල කොට එම රටවල "තන්ත්‍ර වෙනසක්" සිදු කරනු පිනිස මිලිටරි ක්‍රියාමාර්ගයක් සඳහා මාවත සූදානම් කිරීම, ඊශ්‍රායල හා ඇමරිකානු පිලිවෙතේ එක අරමුනක් ලෙස, නිසැක වසයෙන් ම පවතින අතර ම, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ හා ඊශ්‍රායල විදේශ අමාත්‍යංශයේ කොටස් මෙම තන්ත්‍ර සමග තිරයෙන් පිටුපස ගනුදෙනු පවත්වා ගෙන බවට උපකල්පනය කිරීම ද සාධාරන ය. මහ බලවතුන් සමග ගිවිසුමක් ඇති කරගනු පිනිස ඒවා සාර්ථක ලෙස ගසාකා හැකිය යන බලාපොරොත්තුවෙන් වඩා අඩු මට්ටමේ අනුගාමිකයකුගේ ඉරනම සම්බන්ධයෙන් ධනේශ්වර ආන්ඩු කිඹුල් කඳුලු හෙලීමේ ප්‍රථම අවස්ථාව මෙය නොවනු ඇත.

ගාසා තීරයේ තමන්ගේ ජනඝාතන පලස්තීන ප්‍රශ්නයට ඊනියා "රාජ්‍ය දෙකේ" විසඳුමක් සඳහා කොන්දේසි නිර්මානය කිරීමට අවශ්‍ය යයි ඔවුන් ප්‍රකාශ කරන විට, ඊශ්‍රායලය සිය අභිප්‍රායට වඩා වැඩි දෙයක් කියයි. ආරක්ෂක මංමාවත්වලින්, ඊශ්‍රායල ජනපද හා මාර්ග බාධකවලින් බෙදනු ලැබ ඇති, රූකඩ පලස්තීන ධනේශ්වර තන්ත්‍රයක් විසින් මුරකාරයාගේ හා පොලිස්කාරයාගේ ක්‍රියාකලාපය ඉටු කරනු ලබන, පලස්තීන ජනතාවගේ සිරගෙයක් ලෙස සේවය කරනු ඇති, ඊශ්‍රායල ආධිපත්‍යය සහිත රාජ්‍ය කැබැලිත්තක් නිර්මානය කිරීම පෙරදකින මෙම පිලිවෙතෙහි ප්‍රතිගාමී ස්වභාවය එයින් තව දුරටත් එලිදරව් කෙරෙයි. එවන් ප්‍රතිඵලයක්, පලස්තීන කම්කරුවන්ගේ හා තරුනයන්ගේ දෛනික ජීවිතය තුල ආධිපත්‍යය දරන දරිද්‍රතා හා මර්දන කොන්දේසිවලට ආමන්ත්‍රනය කිරීමට කිසිවක් නොකරනු ඇත. එය පලස්තීන බැන්තුස්තානය තුලට සිය අරාබි ජනගහනය පලවා හැරීම මගින් ඊශ්‍රායලය ජනවාර්ගික ශුද්ධ කිරීමකට ලක් කිරීමේ අවස්ථාව සියොන්වාදී රාජ්‍යයට ලබා දෙයි.

පලස්තීන මහජනතාවගේ එකම සැබෑ මිතුරා වන්නේ ජාත්‍යන්තර කම්කරු පන්තියයි. යුරෝපය, ආසියාව හා උතුරු ඇමරිකාව තුල මෙන් ම මැද පෙරදිග දී ද ඊශ්‍රායල ආක්‍රමනයට එරෙහිව පැන නැග ඇති ජාත්‍යන්තර විරෝධතා රැල්ල, මහජන මනෝගතියේ හටගෙන ඇති මාරුව පිලිබඳ පැහැදිලි ලකුනකි. ඊශ්‍රායලයේ යුද අපරාධ සම්බන්ධයෙන් පවත්නා කෝපය සහ පිලිකුල, අධිරාජ්‍යවාදී මිලිටරිවාදයට පමනක් නොව, මහා අවපාතයෙන් පසුව ලෝක ධනේශ්වර ක්‍රමය තුල හටගෙන ඇති ගැඹුරුම ආර්ථික අර්බුදයට ද කම්කරු පන්තියේ වැඩෙන ප්‍රතිචාරයක් පිලිබඳ දර්ශකයකි.

මැද පෙරදිග අර්බුදයට සැබෑ ප්‍රජාතන්ත්‍රික හා ප්‍රගතිශීලී විසඳුමක් සඳහා දොර විවෘත වන්නේ, අරාබි හා යුදෙව් කම්කරුවන් ද ඇතුලු, සියලු රටවල කම්කරු පන්තිය ඒකාබද්ධව බලමුලුගැන්වීම මගිනි. මෙය, ලෝක සමාජවාදී විප්ලවයේ කොටසක් ලෙස, මැද පෙරදිග සමාජවාදී ෆෙඩරේෂනයක් සඳහා සියොන්වාදයට, අධිරාජ්‍යවාදයට හා මැද පෙරදිග ධනේශ්වරයට එරෙහි අරගලයක දැනුවත් රූපාකාරය ගත යුතුය.

මෙය වනාහි සමාජවාදී සමානතා පක්ෂය සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සටන් වදින ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනයයි. ගාසා තීරයෙන් සියලු ඊශ්‍රායල හමුදා වහාම ඉවත් කරන ලෙසත් සම්බාධක ඉවත් කොට සාමාන්‍ය වෙලඳ හා ආර්ථික තත්වයන් මුලුමනින් ම පුනස්ථාපනය කර පලස්තීන ජනතාවට දැවැන්ත පරිමානයෙන් ආධාර සපයන ලෙසත් අපි ඉල්ලා සිටිමු.

**බැරී ග්‍රේ සහ ඩේවිඩ් නොර්ත්**